

# වී.සී.ඊ. ලකුණු ඇවිත් !

ගණිතය පිළිබඳව ආචාර්ය
## නලිනි දේවේන්ද්‍ර

පසුගිය ජනවාරියේ වික්ටෝරියානු අධ්‍යාපන සහතික පත්‍ර (වී.සී.ඊ.) විභාගයේ විශ්ව විද්‍යාල ප්‍රවේශ ප්‍රතිඵල නිකුත් විය. ඉදිරි වසරවල මෙම විභාගයට පෙනී සිටින දරුවන්ගේ දෙමව්පියන් දැනුවත් කිරීමේ අරමුණෙන්, මෙ රට පාසැල් ගුරුවරියක ලෙස නොකඩවා පසුගිය වසර 23 ක සිට සේවය කරන නලිනි දේවේන්ද්‍ර මහත්මිය සමග අප කළ සාකච්ඡාවක අවසන් කොටසයි මේ.

නලිනි දේවේන්ද්‍ර මහත්මිය පේරාදෙණිය සරසවියෙන් වසර 4ක විද්‍යාවේදී (ගණිත විශේෂ) උපාධි පාඨමාලාව හදාරා මෙරටදී අධ්‍යාපන වේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමෙන් පසු 1991 වසරේ සිට ගණිත විෂයය උගන්වන ආචාර්යවරියක ලෙස වික්ටෝරියානු පාසැල්වල සේවය කරන්නීය. ඇයගේ අත්දැකීම් තවදුරටත් බෙදා හදා ගැනීමටයි අපගේ මේ උත්සාහය.

"දරුවෙකුට තමන් යායුතු මාර්ගය හරියට සොයා ගන්නට දෙමව්පියන්ගේ සහයෝගය සහ මගාපෙන්වීම අත්‍යාවශ්‍ය බව අමුතුවෙන් කියන්න දෙයක් නැහැනේ. ඒ නිසා කුඩා කාලයේ සිටම දරුවා සමග සමීප සම්බන්ධතාවක් ඇති කරගන්න එක ඉතාම අවශ්‍යයි. සමහ ශ්‍රී ලාංකික දෙමාපියන් සිතනවා ලංකාවේ දරුවෙක් වගේ ම තමන්ගේ දරුවන්ගේ ගති සිරිත් හැසිරීම ඇතිවන විදිහට දරුවන් හදන්න ඕනැ කියලා. මට නම් හිතෙන්නෙ එකෙන් දරුවාට තරමක අසාධාරණයක් වෙනවා. ඒ වගේම තමයි දරුවා දෙමව්පියන්ගෙන් ඈත් වෙන්නත් පුළුවනි. අප මේ රටට ආවේ මේ රටේ ජීවත් වීමේ බොහෝ ධනාත්මක පැත්තක් තියන නිසායි.

මේ රටේ ඇති දැඩි වෙන, පාසැල් යන දරුවෙකුට ලංකාවේ සංස්කෘතියෙන් අපට ලැබුණු හැම නීතියම හැම සීමාවම පනවන්න ගියොත් ඒකෙන් එතරම් හොඳක් වෙන්නේ නෑ. දරුවා අතරමං වෙන එකත් දෙමව්පියන් සමග සම්බන්ධ කම ඈත් වෙන එකත් තමයි එතකොට වෙන්නෙ. මේ සංස්කෘතිය අපේ සංස්කෘතියට වඩා වෙනස් තමයි හැබැයි මේ රටේ සංස්කෘතිය හරිම නරකයි අපට තමයි හරිම වටිනා සංස්කෘතියක් තියෙන්නෙ කියලා දෙමව්පියන් හිතනවනම් ඒ හිතිවිල්ල ටිකක් වෙනස් කරගන්න දැන් කාලය හරි කියලයි මට හිතෙන්නෙ. මේ සංස්කෘතියෙ තියන ධනාත්මක දේවල් මොනවද කියල හිතල බලල, සොයා බලල ඒ දේවල් ලංකරගන්න දෙමව්පියන්ට සිද්ධ වෙනව. මා මේ රටේ ඉගැන්වීඹ පටන් ගෙනන ගෙවී යන 24 වන වසර මේ වසර. මේ මුළු කාලය මා ඉගැන්වූ පාසැල් වල වැඩිපුර හිටියේ සුදු ජාතික දරුවන්. මා දැන් උගන්වන පාසැලේ 99 ක්ම ඕස්ට්‍රේලියානු ජාතික දැරියන්. මේ දරුවන්ගේ හැසිරීම, කථාබහ හරිම ප්‍රසන්නයි. වැඩ හරිම පිළිවෙලයි. දෙමව්පියන් පාසැල ගැනත් දරුවන් ගැනත් නිතර සොයා බලනවා. දරුවන් සමග ඒ අයගෙ හැම කටයුත්තකටම වගේ මව්පියන් විතරක් නෙවෙයි ආච්චිලා,සීයලාත් සහභාගි වෙනවා.

නලනිගේ සැමියා අසේල ද කථා බහට එක්වෙයි.

"දරුවන් සමග සමීප සම්බන්ධයක් ඇති කරගන්න නම් ඒඅ ය එක්ක සුහද කථා බහකට මග හදාගන්න එක හරිම වැදගත්. එහෙම කරන්න නම් ඒ ගොල්ලන් ගේ ජිවිතයේ වීරයෝ වීරවරියෝ කවුද කියලා අපට හොයා ගන්න වෙනවා. දරුවන් කථාකරන්නට කැමති මාතෘකා ගැන සිතා බලන්න වෙනවා. දරුවන් සැරි සරන වෙබ් අඩවි වලට ගිහින් ඒ අය කැමති නළු නිලියන්, ගායක ගායිකාවන් ක්‍රීඩකයන් සහ අනිත් නොයෙකුත් දේවල් ගැන අවබෝධයක් ලබාගන්න උත්සාහයක් ගන්න එ කමට නම් හරිම ප්‍රයෝජනවත් වෙලා තියෙනවා. දරුවන්ගේ ලෝකයේ සිද්ධ වෙන්නේ මොනවාද කියලා අපට දැනගන්න පුළුවන් වෙන්නේ එතකොටයි."

අසේල සිනාසෙයි. නලිනි නැවත සිය කටහඬ අවදි කරන්නීය.

"තවත් වැදගත් කාරණයක් මෙතනදි මට මතක් වෙනවා. ඔබේ දරුවා වෙනත් දරුවන් සමග සංසන්දනය කරන එක නම් එතරම් ඥාණාන්විත නැහැ. එක දරුවෙක් කරන දේවල් තව දරුවෙකුට බැරිවෙන්න පුළුවන්. හැමෝම එක වගේ නෑ නේ. ඔබේ දරුවා යන ගමන දිහා සැලකිල්ලෙන් බලා ඉඳලා ඔහු හෝ ඇය යා යුතු ඉලක්කය සොයා ගන්නට තීරණ්‍ය කරන්නට ඔහුට හෝ ඇයට ඉඩ දෙන්න. ඒ ගන්නා තීරණයට උපරිම සහයෝගය දෙන්න. එහෙම නැතිව දරුවා ප්‍රාථමික පාසැලට ඇතුල් කළ දවසේ පටන් දරුවා යා යුතු ඉලක්කය ඔබම තීරණය කරලා ඒ ඉලක්කය කරා දරුවාව යවන්න උත්සාහ කරන්න එපා. ඔබ දරුවා වෙනුවෙන් තෝරා ගන්නා ඉලක්කය දරුවා අකමැති හෝ දරුවාව ලගාවීමට අසීරු ඉලක්කයක් නම් ඔබ මොනතරම් කාලය සහ ධනය වැය කළත් වැඩක් වෙන්නේ නෑ. අන්තිමේදී අසම්පූර්ණ අසන්තෝෂයෙන් ජීවත් වන කෙනෙක් සමාජයට බිහිවෙන එක විතරයි වෙන්නේ.

මේ රටේ පාසැල් වල දරුවන්ට නිතරම ධනාත්මක ප්‍රතිචාර ලැබෙනවා. දරුවන් කරන පුංචි පුංචි දේවල් වලට පවා විශාල ප්‍රතිචාර ලැබෙනවා. ඉතින් නිවසේදී දෙමව්පියන් තමන්ගේ දරුවන් අසල්වාසී දරුවන් සමග සංසන්දනය කරමින් දරුවන්ගේ අඩුපාඩු පෙන්වා දෙන එකම විතරක් කරන්නට ගියොත් ඒකෙන් ලොකු හානියක් වෙන්නට පුළුවනි.

මේ කාරණ සම්බන්ධව යතාර්ථවාදීම, උපේක්ෂා සහගතව බලන එක ඉතාමත් ම අවශ්‍යයි. විශේෂයෙන්ම බෞද්ධ දර්ශනයෙහි මේ දේවල් ගැන හොඳට විස්තර වෙනවා නේද?"

නලිනි දේවේන්දා මහත්මිය අපේ කථාබහ අවසානයේ "ඛලීල් ජිබ්රාන්" නම් දාර්ශනිකයාගේ ණ්‍ඕයැ ඡරදචයැඑ□ (ද ප්‍රොපට්) නම් ග්‍රන්ථයෙහි ඇති ඉතා වටිනා කවිපෙළක් අප අතට පත් කළාය. මෙම කවි පෙළෙහි අර්ථය අප සාකච්ඡා කළ කරුණුවලට ඉතාමත්ම අදාල නිසා, අපේ පාඨකයන් වෙනුවෙන් අපි එය සිංහලට පරිවර්ථනය කළෙමු.

ඔබේ දරුවන් ඔබේ නොවේ !
ජීවිතයේ ආශාවන් වෙනුවෙන්
බිහි වූවන් ය, ඔවුහු
ඔවුහු ඔබ තුළින් ඉපදුන ද
ඔබගෙන් උපන්නෝ නො වෙත් !
ඔවුහු ඔබ සමඟ සිටිය ද
ඔබ හට අයිති නො වෙත්!

ඔවුනට ඔබගේ ආදරය දෙන්න
නමුත් ඔබගේ සිතුම් පැතුම්
නො වේ ය දිය යුත්තේ....
ඔවුනට ඔවුනගේ ම සිතුම් පැතුම් ඇත්තේ ය

ඔබ ඔවුන්ගේ ශරීරයට සෙවන දෙය
නමුත් ඒ ඔවුන්ගේ ආත්මයට නො වේ !
හෙට න'මැති නිවසෙහි
ඔවුනගේ ආත්මය පදිංචි වෙයි.
නමුත් ඔබට ඔවුන් බැලීමට එහි යා නො හැක
ඔබගේ සිහිනයකටවත් නො හැකිය.

ඊපෙර දිනයේ සිදු වූ දේ ගැන
තැවි තැවී ජීවිතය බලා සිටින්නේ නැත
ජීවිතය ඉදිරියට ගලා යයි !
- ඛලීල් ජිබ්‍රන්
"ද ප්‍රොපට්"

සාකච්ඡා කළේ:
**සිසිර දිසානායක**

Looking for professional
**Migration advice ?**

The experts in all Australian visa categories with thousands of successful applications from around the world

Our Services :

**We offer you a number of services, ranging from phone consultation to lodging your migration application and appeals on your behalf. Our core services involve:**

- General Skilled Migration
- Partner Migration
- Business Migration
- Parent Migration
- Visit / Tourist Visas
- Student Visas



**Hemantha Punchihewa**
**MARN 0209063**



**Surani Punchihewa**
**MARN 0426579**

**Australian Address :**
**H&S Associates**
**737 Burwood Road,**
**Hawthorn 3123.**
**Australian Contact Number :**
**00 61 419 373 888**
**E-Mail : contact@hs-associates.com**

**AUSTRALIAN MIGRATION CENTRE**

**Sri Lankan Address :**
**5/6, Railway Avenue, Nugegoda.**
**Tele: 011 281 8 833**
**Fax: 011 281 8 835.**
**E-mail : contact@australianmigrationcentre.com**